සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

71 | S | I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................

# සිංහල I

කාලය පැය තුනයි
(අමතර කාලය විනාඩි 10)

- ❖ **පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- ❖ **පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.**

01. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ), සහ (උ) උද්ධෘත අතුරින් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) සහ (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරයම යොදා ගන්න.)

(අ) ඒ අසා දේවතාවාණෝ මෙතැනට අවුත් මා මෙතෙක් කථාකොටත් බමුණාණෝ තුනුරුවන්හි පැහැද පින්කොට නොහෙත් නම් කළ පිට වට වැස්සෙන් කළය ඇතුළට ප්‍රයෝජන නැත්තා සේ මාගේ කථාවෙනුත් ප්‍රයෝජන නැත. මේ කරන කථාවෙන් මුන් ඇතුළු වූ සියල්ලන් සිත පහදවාගත් පමණකින් දෙව් ලොව සැපත් සිද්ධ කරන ලෙසට කියමි, සිතා ''බමුණාණෙනි, තොප කීවා සේ වැඩිමාලුව සිටි තොපගෙන් එලෙස විධානයකුත් නැති හෙයින් දානාදී වූ සෙසු පින්කමක් කටනුහුණුම්හ. එතෙකුදු වුවත් අහේතුකප්‍රතිසන්ධික වූ බකමූණන් පවා සර්වඥප්‍රමුඛ භික්ෂු සංඝයා වහන්සේ කෙරෙහි සිත් පහදාගත් පමණකින් කල්ප ලක්ෂයක් දුගතියට නොගොස් කෙළවර සෝමනස් නම් පසේ බුදුවන කල ඒ චිත්තප්‍රසාදය අපට කැල ම පිහිට වන්නේ වේදැයි මියන ආසන්නයෙහි පිල්කඩ හොත්තා වූ මම බොහෝ දෙනාට දෙන දෙයක් තෝරලා එක් කෙනෙකුන්ට ම දෙවන කලක් පරිද්දෙන් මා ම කෙරෙහි කළ කරුණාවෙන් එතැනට වැඩි බුදුන් දැක ඉඳුරා සිතක් ඇති කෙණෙකුන් දැක නොපහදින්ට බැරි හෙයින් සිත ඉඳුරා පහදවා චිත්ත ප්‍රසාද නැමැති හිණින් දෙව් ලොවට නැංගෙමි' යි කිවුය.

(i) දේවතාවා තම කථාවෙන් ප්‍රයෝජනයක් නැති බව සිතුවේ ඇයි?

(ii) මෙහි සඳහන් දේවතාවා "චිත්ත ප්‍රසාද නමැති ඉණි මඟින් දෙව් ලොවට නැංගා යැයි" සිතන්නේ කුමක් නිසාද?

(iii) **'අහේතුක ප්‍රතිසන්ධික වූ බකමූණන් පවා සර්වඥ ප්‍රමුඛ භික්ෂු සංඝයා වහන්සේ කෙරෙහි සිත් පහදවා ගත් පමණින්''** මෙම උධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) **'තුනුරුවන්'** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි)

(ආ) එකෙණෙහි එනුවර අරක්ගත් දේවතාවා ''මාගේ අනුරුද්ධ කුමාරයෝ මව්කුසින් උපන් දා පටන් නැතැයි යන බසෙහි අර්ථ නොදත්තාහුය. එබසෙහි අර්ථ දැනපු නම් උන්ගේ පින් බලයෙන් මා ඉස සත්කඩක්ව පැළීයෙයි'' කියා මරණභයින් වෙවුලා ඒ ගෙන යන්නා වූ තලියෙහි දිව්‍ය වූ සුවඳ කැවුම් මවාලීය. එවේලෙහි ගෙන ගොස් තලිය අනුරුද්ධ කුමාරයන් ඉදිරියෙහි තබාලා ගෙන ගිය පුරුෂයා අක්කොලින් මඳක් සිනා සී "ස්වාමීනි තෙලෙ නැති පූ කැව මැනැව'යි කියාලා මත්තෙහි තිබූ රන්තලිය ඔසවාපීය. එකෙණෙහි ඒ දිව්‍ය කැවුමෙහි සුවඳ ඒ සා මුළු නුවර මුළුල්ලෙහි හමා බස්නට පටන්ගත, එයින් එක කැවුමක් හැරගෙන දිව අග තබාලූ වේලෙහි අනුරුද්ධ කුමාරයන්ගේ සකල ශරීරය පිනවාගෙන සත්දහසක් රසනහර රසයෙන් පුරා සිටගත.



**මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.**

(i) නුවරට අරක්ගත් දේවතාවා බිය වූයේ ඇයි?

(ii) තමාට සිදුවෙතැයි සිතූ විපතින් බේරීමට දේවතාවා කුමක් කළේද?

(iii) **"සකල ශරීරය පිනවාගෙන සත් දහසක් රස නහර රසයෙන් පුරා සිටගත"** මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) **'අක්කොලින්'** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි)

(ඉ) එකල්හි උතුම්ගුණ ඇති පතිවත් වූ ඇගේ ශෝකාග්නි වේගය සුවාසු දහසක් යොදුන් උඩ නැගී සක්දෙව් රජුහුගේ භවනය හුණු කළේය. ශක්‍රදේවේන්ද්‍රයෝ දහසක් නුවණැසින් ලොව බලනුවෝ මේ කාරණය දැක බමුණු වෙසක් ගෙන ඇසිල්ලකින් අවුත් මහබෝසතාණන් ඔත් ගල් මුදුනෙහි පෙනී කෙණ්ඩිකාවෙන් පැන් ගෙන මහ බෝසතාණන් ඇඟ ඉසලූහ. එකෙණෙහි විස නැසී වණය සුව ව කොතන විදි බවත් නොදත හැකි විය. මහබෝසතාණන් එවිට අනුන් වෙහෙසන්ට මළ වෙස් ලා වැදහොත් එකක පරිද්දෙන් වහා නැගී සිට සුවපත් වූයේ ය. චන්ද්‍රිකාව ද එසද සුවපත් ව සිටි ප්‍රිය ස්වාමි දැක බලවත් වූ සොම්නසට පැමිණ, ස්වාමීණි, යම් බඳු නුඹ වහන්සේ මාගේ ප්‍රියකල් වූ ඇඟ අමාපැන් ඉස නිදුක් කොට මාගේ එකලාකම් දුරුකොට ප්‍රිය වූ අප දෙදෙනා සමඟ කළ සේක්ද? එසේ වූ නුඹ වහන්සේගේ ශ්‍රී පාදය වඳිමියි වැද හෙත්තීය. ශක්‍රදේවේන්ද්‍රයෝ ද උන්දැක බලවත් සොම්නසට පැමිණ ''මෙතැන්හි නොවසව පර්වතයෙන් බැස මිනිසුන්ට විසය තැන නොවෙසෙත්වයි අවවාද කොට තමන්ගේ දිව්‍යලෝකයට ගියාහ''.

(i) ශක්‍රදේවේන්ද්‍රයෝ දහසක් නුවණැසින් ලොව බැලුවේ කුමක් නිසාද?

(ii) චන්ද්‍රිකා තම ස්වාමියා සුවපත් වූ පසු කුමක් කළේද?

(iii) **''මහබෝසත් එවිට අනුන් වෙහෙසන්ට මළ වෙස්ලා වැද හොත් එකකු පරිද්දෙන් වහා නැගී සිට සුවපත් වූයේය''** මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) **'ශෝකාග්නි'** යන්න පිළිබඳව කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 04 යි)

(ඊ) එකල්හි ස්වර්ණතිලකාවගේ පියා ද යහපතැයි ගිවිස විසිතුරු වූ කර්මාන්ත ඇති දහසක් වටිනා පලසකින් දුවගේ ශරීරය වසා පොරවා තමා ගායනා කරන වීණාදී වූ තූර්යභාණ්ඩ ගෙන්වාගෙන ස්වර්ණතිලකාවන් හා සමඟ මඟට බැස නික්මිණි. මෙසේ නික්මුණා වූ ඒ චණ්ඩාල බ්‍රාහ්මණතෙම අතරමග එක් නුවරෙක රජ්ජුරුකෙනෙකුන් දැක වීණා ගායනා කරනුයේ, ස්වර්ණතිලකාව තමා පිටිපස හිඳිනාසේ සලස්වා තෙමේ වීණා ගායනා කරන්නට පටන්ගත. එකල්හි ඔහු පිටුපස හුන්නාවූ ස්වර්ණතිලකා තොම නුවන් කෙළවරින් දෘෂ්ටිය හෙළා ස්වකීය වූ ස්ත්‍රී ලීලාවෙන් යුක්තව මදලස බැල්මකින් රජහු මුහුණ බලා තමා පෙරව හුන් පලස මඳක් පහකොට ශරීරප්‍රභා දක්වාලූව. රජ්ජුරුවෝ ඇගේ ශරීරාලෝක හා රූප සම්පත්තිය දැක කාමයෙන් විසංඥව සිහිමුළාව මද ඇසිල්ලකින් ලබන ලද ආශ්වාස ඇතිව මෝ තොම සස්වාමිකද අස්වාමිකද විචාරා "අස්වාමිකය එතෙකුදු වුවත් සැඩොල් දුවක'' යනු අසා.....

(i) ස්වර්ණතිලකාගේ සිරුරට පොරවා ඇත්තේ කවර වස්ත්‍රයක්ද?

(ii) ස්වර්ණතිලකා දැකුමෙන් රජතුමාට කුමක් සිදුවීද?

(iii) **''ස්වර්ණතිලකා තොමෝ නුවන් කෙළවරින් දෘෂ්ටිය හෙළා ස්වකීය වූ ස්ත්‍රී ලීලාවෙන් යුක්තව මදහස බැල්මකින් රජුගේ මුහුණ බලා ''** මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) **'ශරීරප්‍රභා'** යන්න පිළිබඳව කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 04 යි)

(උ) යුදෙහි ඔහු කඟලිය
සමඟ රුපුනොද වෙව්ලිය
උනඹු සිතුවිලි ලිය
සමඟ ඔහු යස ලියද ලියලිය

දිමුතු කිතු මුතුහර
කැර දිගු පියන් පියවුර
දස රජදම් නොහැර
එරජ රජකරනා සඳ එනුවර



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(i) සතුරන් වෙව්ලා ගියේ ඇයි?

(ii) මෙහි කීර්තිය සමාන කර ඇත්තේ කුමකටද?

(iii) **''ඔහු යය ලිය ද ලිය ලිය ''** මෙම උද්ධෘතය සරල බසින් ලියන්න.

(iv) **'දසරජදම්'** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි)

(උ) පහත සඳහන් උද්ධෘත ඇසුරෙන් 04 ක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "පිළිවන් පිළිවන් ලෙසින් පින්කම් හැසිර වසව."

(ii) ''බත් උපදින්නේ බඩසලින් නොවේ."

(iii) ''මට සිනාසෙන්න කාරණා කිම්ද?''

(iv) "ඒ බ්‍රාහ්මණයා ජාති සම්පන්නය.''

(v) "මට උඹත් එකක් වචනයක් කතා කරගන්ඩ තියනව.''

(vi) මැණික නම් මැණික වේ.

(vii) ''මොනවද ඔය හොයන්නේ?'' (ලකුණු 3x4 = 12 යි)

(එ) පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි වස්තු විෂයෙහි සහ ආකෘතියෙහි විශේෂතා කෙරෙහි අවධානය යොමු කරමින් එම නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

සිහිලැල් සිනාවට උණු කඳුළු නැවුණා
කඳුළෙහි සියුම් දහමෙක රසය ගැවුණා
උස් කඳු මුදුන් ගන මීදුමක පා වුණා
අරුණාලෝකයක් ඇඳිරියට යා වුණා

කළු ගල් පවා වන මල් පෙති මෙන් මුදු වේ
දවසෙක එහෙත් මල් පෙති කළු ගල් බඳු වේ
ලුහුබැඳ ගමන් ගත් අදහස් ඇත පොදුවේ
සිතු දෙය නොසිදු වේ නොසිතුව දෙය සිදු වේ

හෙල් තැනිතලාවල උඳුවප් දුරුතු මහේ
ලස්සන දැකුම්කලු දේ අද බැලිය නොහේ
හිරිමල් හලන්නට ගඟ බඩ ඇටඹ ගහේ
මින් පසු නො ඒවා සීතල සුළඟ මෙහේ

උස් කඳු මුදුන්වල වැජඹෙන සිරිමලිය
ඔබගෙන් අලුත් දහමක් මට පැහැදිලිය
රූමත් මුහුණකට ඇති මිහිරි ම එළිය
සිහිලැල් සිනා රැළි නොව උණු කඳුළැලිය

රහසක් අනුව ඔබ හදවත ඔබට නොකී
මා ගැන අඳුරු සෙවණැලි හැම තැන ම දකී
පිය සටහන් ඇතත් කඳු හෙල් අතර මැකී
ගී හඬ ඔබට වා මඩලින් ඇසිය හැකී

කඳු බෑවුමේ දිය වැල් ගල් කුළෙක හැපී
වෙන් වී ගලාගෙන ගොස් දෙකඩකට කැපී
නැවතත් එකතු වන මෙන් පෙණ බුබුළු පිපී
කවදා කොතනකදී හෝ මුණගැහෙමු අපී



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP-EXAM

දේදුනු-වලාකුළු කඳුගැට දකින තුරු
බොල් පිනි පොකුරු හිරිකඩ වැසි වැටෙන තුරු
මීදුම ගලන තුරු, වන මල් පිපෙන තුරු
ඔබ අමතක නොවේ කළු ගඟ ගලන තුරු

මුළු ලොව කිසිවකුට කිසි දවසකදි මතු
රහසක් නොවේවා යට ගිය යුගයෙ තතු
ඔබගේ හේළි කිවි මැදුරෙහි දවල බිතු
තිබුණා වගේමයි වෙනසක් නොවිය යුතු

සැඟවුණු ගිනි පුපුර අළු යට නිවේ නම්
ඊ මත අලුත් සිසිලක් කිති කැවේ නම්
මේ දිවි ගමන කෙටි මංගකට ගෙවේ නම්
හමු වනුවට අගෙයි, යළි හමු නොවේ නම් (ලකුණු 12 යි)

**(සැ.යු. වස්තු විෂය හා ආකෘතියෙහි විශේෂතා සඳහා ලකුණු 05ක් ද පද්‍ය රසාස්වාදයට ලකුණු 07ක් ද ලෙස ලකුණු 12 ක් ලැබේ)**

02. (අ) පුරාතන සිංහල ගද්‍ය සාහිත්‍ය කෘති වලින් විද්‍යාමාන වන පොදු ලක්ෂණ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 07 යි)

(ආ) සද්ධර්මරත්නාවලී කතුවරයා නිර්මාණාත්මක භාෂා ලක්ෂණ ඇසුරින් කථාව හරවත්ව හා රසවත්ව ඉදිරිපත් කිරීමට සමත් වී ඇත. මට්ටකුණ්ඩලී කතා වස්තුව ඇසුරින් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

**නැතහොත්**

සදාචාරාත්මක ජීවන පැවැත්ම තුළින් ජීවිතයන්ට එල්ලවන අභියෝග ජයගත හැකි අයුරු චන්නකින්නර ජාතකයෙන් අනාවරණය වේ. නිදර්ශන සහිතව පහදන්න. (ලකුණු 08 යි)

03. ස්වර්ණාතිලක කථා වස්තුවේ ස්වර්ණාතිලකගේ චරිතය තුළින් පුරාණ යති මතය අනාවරණය කර ඇත. පහදන්න.

**නැතහොත්**

අනුරුද්ධකුමාර කථාවස්තුවෙන් සංසාරික ජීවිතයේ සත්වයාට මුහුණ පෑමට සිදුවන දුක්ඛ දෝමනස්සයන් පිළිබඳව මනාව විවරණය කර ඇත. විමසන්න

(ලකුණු 15 යි)

04. (අ) සිංහල පද්‍ය සාහිත්‍ය ගී කාව්‍යයෙන් ආරම්භ වුව ද පසු කලෙක සරල සිව්පද කාව්‍ය දක්වා ක්‍රමිකව විකාශනය විය. උදාහරණ සහිතව විමසන්න.

(ආ) ගුත්තිල කවියා විවිධ අවස්ථා ඉතා විචිත්‍ර ලෙස නිරූපණය කරනු ලබයි. අදාල වර්ණනා තුනක් ඇසුරින් මෙම කියමන පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

05. ''ජීව-අජීව වස්තූන් කෙරෙහි සංවේදී හදවතක් ඇත්තෙකි සිළිඳු'' විමසන්න. (ලකුණු 15 යි)

06. ඉතා සූක්ෂම අයුරින් සමාජ දුර්වලතා උපහාසයට ලක්කර ඇති ආකාරය නිර්දිෂ්ට කෙටිකතා **තුනක්වත්** ගෙන විමසීමකට ලක් කරන්න. (ලකුණු 15 යි)

07. කොළඹ කවියේ ද්විතීයිය තරංගයට අයත් කවියන් පද්‍ය නිර්මාණකරණයේදී අනුගමනය කරන ලද සුවිශේෂී ලක්ෂණ මොනවාදැයි නිර්දිෂ්ට පද්‍ය පන්ති තුනක් ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි)

08. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් ගේ ''ප්‍රේමතෝ ජායති සෝකෝ'' නාට්‍ය පෙළ මූලාශ්‍ර කථා වස්තුවෙන් කොතෙක් දුරට වෙනස් වන්නේදැයි පෙන්වා දෙන්න. (ලකුණු 15 යි)

* * *



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP-EXAM

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

71 | S | II

## පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 13 - 2020

විභාග අංකය ............................

## සිංහල II

කාලය පැය තුනයි
(අමතර කාලය විනාඩි 10)

- **I කොටසේ 1 ප්‍රශ්නය ද II කොටසේ 2 හා 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **I ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **I කොටස II කොටසේ පිළිතුරුපත් සමඟ අමුණා භාර දෙන්න.**

## I කොටස

01. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන, එයට හිමි අංකය වරහන් තුළ ලියන්න.

1.1 නාසික්‍ය අක්ෂර පමණක් අන්තර්ගත වරණය තෝරන්න

(1) ශ, ෂ, ස, හ, ෆ  (2) ක, ච, ට, ත, ප  (3) ය, ර, ල, ව, ළ
(4) ඟ, ඦ, ඬ, ඳ, ඹ  (5) ඞ, ඤ, ණ, න, ම  (...........)

1.2 **නිවැරදි** අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) අභිලාසය, ප්‍රෂංසාව, විකාසය, යෂ්ඨීය, ධර්මිෂ්ඨ
(2) අබිලාසය, ප්‍රසංශාව, විකාශය, යශ්ටිය, ධර්මිශ්ට
(3) අභිලාශය, ප්‍රසංශාව, විකාෂය, යෂ්ඨීය, ධර්මිෂ්ට
(4) අභිලාෂය, ප්‍රශංසාව, විකාශය, යෂ්ටිය, ධර්මිෂ්ඨ
(5) අබිලාශය, ප්‍රශංෂාව, විකාසය, යශ්ඨීය, ධර්මිෂ්ට  (...........)

1.3 අකාරාදී පිළිවෙළ අනුව **නිවැරදිව** ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) අමාවතුර, කව්සිළුමිණ, ධර්මප්‍රදීපිකාව, පැරකුම්බා සිරිත
(2) කාව්‍යශේඛරය, සුභාෂිතය, බුත්සරණ, සඟසරණ
(3) ධම්පියා අටුවා ගැටපදය, කුසදාකව, බුදුගුණ අලංකාරය
(4) දහම්සරණ, දහම්ගැටමාලය, මුවදෙව්දාවත, ලෝවැඩ සඟරාව
(5) පරමත්ථජෝතිකාව, ලෝකෝපකාරය, ගුත්තිල කාව්‍යය, සියබස්ලකර  (...........)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **නිරවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) 'අ' කාරය තුළ සංවෘත විවෘත භේදයක් නොපවතී.
(2) අන්තඃස්ථ අක්ෂර තුළ ස්වර හා ව්‍යඤ්ජන යන ලක්ෂණ දෙවර්ගය ම පවතී.
(3) වර්ගාක්ෂර ගණයට ඟ, ඦ, ඬ, ඳ, ඹ යන අක්ෂර අයත් වේ.
(4) උගුර සහ දිව මුල කරණ කර ගනිමින් ඕෂ්ඨජ අක්ෂර බිහිවේ.
(5) ස්වර අක්ෂර සියල්ල අඝෝෂ ගණයට අයත් වේ.  (...........)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.
(1) තෙවලා ධර්මය, ක්‍රීඩා පුවත්, ශිතල පැන්, රන් අබරණ
(2) සඳ කිඳුරු ජාතකය, ගෘහ දිවිය, සසර බිය, වෙසක් මංගල්‍යය
(3) අන්තර්ධාන, ස්වර්ග මෝක්ෂ, ප්‍රධාන ද්වාරය, මධ්‍යම ප්‍රතිපදාව
(4) දකුණු ශාඛාව, නිර්මල දහම, ගිලන් උපස්ථාන, පාප මිතුරා
(5) අහස් යාත්‍රාව, ඊශ්වර දෙවි, ලිඛිත වහර, සඳ මඩල (...........)

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක්ද?
(1) චර්ම, චාරිත්‍ර රඟ, ගඟ, පැන,
(2) අඤ්ජන, දණ්ඩ, මණ්ඩප, සංඝ
(3) කමිස, කලිසම, කාන්දම්, මැද
(4) වැසි, ඥාති, රෑ, වැල
(5) ඉස්තෝප්පු, කරාබු, කොකිස්, සෑය (...........)

1.7 තත්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) චාරිත්‍ර, චාප, සක, සිත්
(2) ගන්ධ, අන්ධ, දෙවිඳු, නන්දන
(3) සඳ, දඹ, සම, සිවුරු
(4) ලම්බ, ස්තම්භ, කුඹ, මඬු
(5) මුළා, දළ, අඩ, වස් (...........)

1.8 අදර, සපදන්, කරණ, සබඳ යන විභක්තිවලට අයත් සමාස පද පිළිවෙළින් දක්වා ඇති වරණය තොරන්න.
(1) පින්හාල්, සරාසඳ, රන්කම්, ඇත්දළ
(2) සරාසඳ, රන්කම්, පින්හාල්, ඇත්දළ
(3) රන්කම්, ඇත්දළ, පින්හාල්, සරාසඳ
(4) සරාසඳ, පින්හාල්, රන්කම්, ඇත්දළ
(5) ඇත්දළ, රන්කම්, පින්හාල්, සරාසඳ (...........)

1.9 **කෘදන්තයක් නොවන** පදයක් අන්තර්ගත වර්ණය තෝරන්න.
(1) කපන, නටන, හඬන, බලන
(2) මතුළ, අතුළ, විචාළ, හළ
(3) පිහිටි, ගැයූ, බැලූ, කෑ
(4) කියනු, ලියනු, රකිනු, නටනු
(5) නැටුම්, ගැයුම්, වැයුම්, ගවුම් (...........)

1.10 පහත සඳහන් උද්ධෘතවල **තද කළු** අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(අ) **ගලා** බසින ඇළ කඳුරු
(ආ) නමා **කඩනු** මිස ගසකට
(ඉ) තනේ කිරි **දීදී** ඇති කළ දෙදරු වනේ
(ඊ) **කියත** උන් මෙතෙපල

(1) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
(2) විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා
(3) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා
(4) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා
(5) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා (...........)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.
AWP - EXAM

1.11 තද්ධිත පදයක් ඇතුළත් **නොවන** පද පේළියක් තෝරන්න.

(1) රුසියානු, කියුබානු, ඇමරිකානු, කොරියානු
(2) විද්‍යාඥ, ගණිතඥ, සංගීතඥ, නීතිඥ
(3) ඉහළ, පහළ, වියළ, පියළ
(4) දිරිමත්, ධීමත්, සිරිමත්, ශ්‍රීමත්
(5) කනිෂ්ඨ, පාපිෂ්ඨ, ශ්‍රේෂ්ඨ, ධර්මිෂ්ඨ (...........)

1.12 උපසර්ගයක් යෙදී **නොමැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) උපකාර, පරිවාර, ප්‍රත්‍යක්ෂ, අවමඟ
(2) දුරාචාර, අවකාර, පිහිකුළු, විමල්
(3) අවගුණ, පවර, මලවි, දුගඳ
(4) ප්‍රතිලාභ, නිමල, අමිත, උපත
(5) සවල, විපක්ෂ, ප්‍රබල, පිරිසිදු (...........)

1.13 නිපාත පදයක් ඇතුළත් **නොවන** පද පේළිය තෝරන්න.

(1) මෙන්, සේ, වන්, ගම්
(2) විනා, හැර, මිස, මුත්
(3) ද, යි, හා, සමඟ
(4) විකේ, ඔහෝ, අහා, අපෝ
(5) ය, යි, හ, හු, යැ (...........)

1.14 ''**බල** ගඟ දිය **කෙළනා** ලිය **සසොබා**.'' යන වැකියෙහි තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන්නේ කුමන වියරණ අංගවලටද?

(1) ක්‍රියා, කෘදන්ත, අව්‍යපද
(2) ක්‍රියා, අව්‍යපද, සන්ධි
(3) අව්‍ය පද, සන්ධි, අව්‍ය පද
(4) ක්‍රියා ,අව්‍ය පද, කෘදන්ත
(5) ක්‍රියා, සන්ධි, කෘදන්ත (...........)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියාරූප සහිත වරණය තෝරන්න.

(1) කවිත්ව, ග්‍රාමීය, මාධූර්ය, පියළි
(2) බමන, වියන, රකින, අඳින
(3) කැඩීය, යද්දි, හැඬිණි, ලියනුව
(4) විසම, පරපද, දුදන, දෙවිඳු
(5) රීතීන්, හේතූන්, ගොවීන්, ඈ (...........)

1.16 සමාසයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) මිහිඳුම්, මුහුදු සුළං, රන්කම්, වනමල්
(2) ඉපැරණි, ඉසිවර,, ඉමහත්, ඉමිහිරි
(3) තෙරුවන්, නවගුණ, පංචසිඛ, දෙලොව
(4) නිලුපුල්, සඳවත, පාපියුම්, මුවකමල
(5) මීවද, බුදු දහම, මව්කිරි, කුරුළු පිහාටු (...........)

1.17 එකම වර්ගයට අයත් සන්ධිපද අන්තර්ගත වරණය තෝරන්න.

(1) තියුණු, ගුරුන්, දිවැස, නුවණැති
(2) නිලුපුල්, අතිනත, වටොර, දැවුරුදු
(3) අල්ලස්, ගොක්කොළ, ලිග්ගල, ඇත්දළ
(4) තම්පලා, කටුවල, වියවුල්, තුණුවග
(5) පොල්ලත්ත, ජීවනෝපාය, අස්සල, ඈත (...........)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

1.18 ව්‍යාකරණානුකූලව **නොගැලපෙන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) ගැමි, රැටි, භූමි, දිවි
(2) නිසරු, නීරෝගී, නිමල, නිසල
(3) සේ, එව්, බඳු, වැනි
(4) ගුරුතුමා, මිණිභරණ, බුදුගුරු, තියුණු
(5) මුවකමල, පාපියුම්, සඳවත, උපුල්නුවන් (...........)

1.19 ව්‍යාකරණානුකූල **නිවැරදි** වැකිය තෝරන්න.
(1) ශ්‍රී රාහුල හිමියන් සැළලිහිණි සන්දේශය රචනා කළහ.
(2) සාමාජිකයන් යෝජනා ඉදිරිපත් කරයි.
(3) රිය අනතුරෙන් එක් අයෙක් මරණයට පත්වූහ.
(4) සමහරු බොහෝ වෙහෙසුණ ද විභාග අසමත් වෙති.
(5) විදුහල්පතිතුමා විසින් ගුරුවරුන් පසසන ලදහ. (...........)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍ය සහිත වරණය තෝරන්න.
(1) කොරෝනා මරණ දැන් කීයද?
(2) මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ තරුණ-තරුණියන්ට වගකියන්නේ කවුද?
(3) සාධාරණ ලෙස මහමැතිවරණය පැවැත්විය යුතුය.
(4) රුපියල් පන්දාහේ දීමනාව සේරටම දෙනවලු.
(5) පුරන් කුඹුරු අස්වද්දන්න ගත්ත තීරණය හොඳයි. (...........)

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

# II කොටස

- මෙම කොටසින් 2,3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

02. (අ) පහත පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"සමාජ සුබ සාධනය මත පදනම් වූ තහංචි ක්‍රියාත්මක වන්නේ සමාජ සංවිධානයේ සුරක්ෂිතතාව හා පැවැත්ම වෙනුවෙනි. මෙහිදී එම තහංචි නීති රීති පද්ධතියක ස්වරූපයෙන් ක්‍රියාත්මක වනු දැකිය හැකිය. වරිග තහංචිය හා තොවිල් තහංචිය ඒ අතරින් වැදගත් වේ.

වරිගය යනුවෙන් හඳුවන්නේ බ්‍රිතාන්‍ය යුගයේ දී නුවරකලාවියට පමණක් සීමා වූ සමාජ සංස්ථාවකි. එය උප කුලයක් බව එච්.ආර්.ලීච්ගේ අදහස වුවද ප්‍රාථමික සමූහයක් වූ වරිගය අන්තර්ජන්‍ය සංස්ථාවක් ද විය. සිංහල විවාහ ක්‍රමය තුළ සමකුළභාවය සඳහා හිමි වූයේ වැදගත් ස්ථානයකි. වරිගය, අන්තර්ජන්‍ය විවාහයට වැඩි කැමැත්තක් දැක් වුවද එකම කුලයේ අනෙකුත් වරිග සමඟ බහිර්ජන්‍ය විවාහ සඳහා ඉඩ සලසයි. ඊට පටහැනිව පහත් කුලයක කාන්තාවක් විවාහ කරගත්තේ නම් එකී තරුණයාට එරෙහිව වරිග තහංචිය පැනවේ. තාවකාලික තහනම හා ස්ථිර තහනම වශයෙන් මෙය දෙයාකාරය. තාවකාලික තහනමේදී සිදුවන්නේ, සම්මුති බැඳීමක් මගින් සමාව ගැනීමට වරදකරුවන් එකඟ වන තුරු එම යුවළ තාවකාලිකව වරිගයෙන් නෙරපීම හෙවත් ඥාතීන්ගේ ඉලව් මගුල් සඳහා සහභාගි කර නොගැනීමය. තහංචිය ඉවත් වනුයේ සම්මුති බැඳීමෙන් පසුවය.

වරිග සභාව යනු එකම කුලයේ අය එක් රැස්වන සභාවයි. එමගින් විසඳනු ලබන්නේ කුල අරගල පමණි. වරිග සභාවේ උඩමළුවෙහි ගම්වැසියෝද පහත මළුවෙහි වරදකරුවෝද රැස්වෙති. දඬුවම් වශයෙන් වත්කමෙහි පරිදි රිදී 50-100 දක්වා දඩ ගසන අතර වරද කළවුන් ලවා උඩමළුවේ සිටින්නන් හට වන්දවා ඔවුන්ව යළිත් උඩමළුවට ඇතුළු කර ගැනේ.

(i) සමාජ සුභ සාධනය මත පදනම් වූ තහංචි දෙකක් නම් කරන්න.
(ii) තහංචිවල අරමුණ කුමක්ද?
(iii) වරිග තහංචිය පනවන අවස්ථාවක් සඳහන් කරන්න.
(iv) තාවකාලික තහනම කෙටියෙන් දක්වන්න.
(v) තහංචි ඉවත් වන්නේ කෙලෙසින් ද?
(vi) තහංචියට හසු වූවකුට ලබා දෙන දඬුවම කුමක් ද? (ලකුණු 12)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වනසේ සාරාංශ කොට ලියා සාරාංශයේ අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

නූතන කෙටිකතාව පැරණි කතාන්තරවල ක්‍රම විකාශනයෙන් පහළ වූවකි. පැරණි සාහිත්‍යයේ හමුවන විවිධ කතා හා නූතන කෙටිකතා අතර සමාන ලක්ෂණ මෙන්ම අසමාන ලක්ෂණ ද කිහිපයක්ම ඇත. නූතන නවකතාවට ඇතැම් අංශවලින් සමාන දිග කතාන්තර පැරණි සාහිත්‍යයේ ද ඇත. කිසියම් කතාවක දිග ප්‍රමාණය අනුව එය නවකතාවක් නොවන්නාක් මෙන් ම කෙටි වූ තරමින් ම කිසියම් කතාවක් කෙටිකතාවක් බවට ද පත් නොවේ. සාමාන්‍යයෙන් බාහිර වශයෙන් බැලූ බැල්මට දක්නට ලැබෙන දිග ප්‍රමාණය මත මෙකල කතාවක් නවකතාවක් වශයෙන් හෝ කෙටි කතාවක් වශයෙන් හෝ හඳුන්වන සිරිතක් ඇතමුන් අතර ඇතත් එය එතරම් ප්‍රශස්ත නොවේ. බොහෝ නූතන කෙටිකතාවල ඇත්තේ එක් ප්‍රධාන සිද්ධියකි. ඊට සම්බන්ධ අතුරු හෝ අප්‍රධාන හෝ සිද්ධීන් කිහිපයක් ම තිබිය හැකි ය. මේ නිසා නවකතාවට වඩා කෙටිකතාවේ සන්දර්භයේ සරල බවත් දක්නට ලැබෙයි. නවකතාවේ සිද්ධි මාලාවක් ඇතුළත් වෙයි. ඒවා මැනවින් හේතු ඵල නියාමයකට අනුව පෙළ ගසා ඇතැයි කියනු ලැබූවත් ඇතැම් නූතන නවකතාකාරුවෝ තර්කානුකූල බව හෝ හේතු ඵල නියාමය ගැන හෝ එතරම් නොතකා නොයෙකුත් නව ක්‍රම අනුව සිදුවීම් ඉදිරිපත් කරති.

කතාවක් කුමන ක්‍රමයකින් ඉදිරිපත් කරනු ලැබුව ද එහි කිසියම් වැදගත් අත්දැකීමක් අදහසක් හෝ ජීවන දෘෂ්ටියක් ඇතුළත් විය යුතු යැයි සලකනු ලැබේ. පැරණි කතාකරුවා සිය කතාන්දර මගින් වැඩි වශයෙන් බලාපොරොත්තු වූයේ පාඨකයකුට විනෝද රසයක් ලබා දීම, ආදර්ශ හා උපදෙස් දීම, ආගම හෝ නීතිය වැනි විෂයක් ඉගැන්වීම යි. පංචතන්ත්‍රය වැනි සංස්කෘත කෙටිකතා සංග්‍රහයක මෙම ලක්ෂණ පැහැදිලි ව දක්නට ලැබේ.

NMP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

(i) රටක් සංවර්ධනයේදී දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනයේ වැදගත්කම.
(ii) මත් උවදුර අනාගත තරුණ ශ්‍රම බලකාය කෙරෙහි බලපෑම.
(iii) ගෝලීය වසංගත තත්වයන් හමුවේ බිඳී වැටෙන ලෝක ආර්ථිකය.
(iv) සාහිත්‍ය පුද්ගල පෞරුෂ වර්ධනයට අනුබලයකි.
(v) නවීන තාක්ෂණය ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලියට මෙවලමකි. (ලකුණු 25)

04. (අ) පහත දැක්වෙන වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.
(i) නාවික සෙබළුන් දෙළොස් දෙදෙනෙකු රෝහලට ඇතුළත් කෙරේ.
(ii) දරුවෙකු වේදනාවෙන් ඇඩූහ'යි ගුරුතුමිය පැවසුවාය.
(iii) සමාජ චාරිත්‍ර වාරිත්‍ර කලින් කලට වෙනස් වෙති.
(iv) නව ජනපතිතුමා දූෂණ විමර්ශන කොමිසමක් පත් කරනු ලබයි.
(v) බොහෝ දෙනාගේ ගෞරවය පාත්‍රවූ සමාජ සේවිකාව ඊයේ අභාවප්‍රාප්ත විය.
(ලකුණු 1x5 = 05)

(ආ) පහත දැක්වෙන වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.
(i) නළු නිළියෝ ප්‍රේක්ෂකයන් කුල්මත් කරති.
(ii) සෞඛ්‍ය ඇමතිවරිය නව තනතුරට ලේකම්වරියක් පත් කළාය.
(iii) ආදිශිෂ්‍යයෝ ආදිශිෂ්‍යාවන් සාදරයෙන් පිළිගත්හ.
(iv) භාෂාවෝ කලින් කලට නව නීති රීති නිර්මාණය කරති.
(v) මුරකරුවා අප කැඳවාගෙන ගියේය. (ලකුණු 1x5 = 05)

(ඉ) **නිවරදි** වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.
(i) (ගුරුවරු/ගුරුවරුන්) විසින් (දරුවෝ/දරුවන්) යහමග යවනු ලබති.
(ii) සමාජයේ (දෙවියෝ/දෙවියන්) වැනි (මිනිස්සු/මිනිසුන්) අප අතර වෙති.
(iii) රූස්වීමේ මූලාසනය (අමරසේකරයෝ/අමරසේකරයන්) හෙබවූ අතර (කලාකරුවන්/කලාකරුවෝ) විශාල පිරිසක් ඊට සහභාගි වූහ.
(iv) ආචාර්ය ආනන්දකුමාරස්වාමි කලා (විචාරකයෙක්/ විචාරයෙකු) මෙන් ම හොඳ (රසිකයෙක්/රසසිකයකු) ද විය.
(v) සඳ පහන ඇති රැයක (බල්ලන්/බල්ලෝ) බුරනවා (අපට/අපිට) නිතර ඇසේ. (ලකුණු 1x5 = 05)

05. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

(i) **පුතු** නළවනු **පිණිස** කට බොරුම **කිය කියා**
(පුතු - විභක්ති, පිණිස - නිපාත, කිය කියා - ක්‍රියා)
(ii) **මැණියෝ** තම **දරුවන්ට** යහපත් **සිරිත් විරිත්** කියා දුන්නාය.
(මැණියෝ - තද්ධිත, දරුවන්ට - විභක්ති, සිරිත් විරිත් - සමාස)
(iii) **දුප්පත්** දරුවන් **උදෙසා** පිරිනමන **ශිෂ්‍යාධාර** ක්‍රමයක් අධ්‍යාපන අමාත්‍යාංශය හඳුන්වා දුන්නේය.
(දුප්පත් - සන්ධි, උදෙසා - නිපාත, ශිෂ්‍යාධාර - සන්ධි)
(iv) **රන් තරුවක්** වගෙයි **කිරි මුහුදෙහි ගිලුණු**
(රන් තරුවක් - සමාස, කිරිමුහුදෙහි - විභක්ති, ගිලුණු - කෘදන්ත)
(v) **පාලකයන්ගේ දූර්වලතා නිසා** රට දිනෙන් දින පිරිහෙයි.
(පාලකයන්ගේ -විභක්ති, දූර්වලතා - තද්ධිත, නිසා - නිපාත) (ලකුණු 3x5 = 15)



**මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.**

NWP-EXAM

06. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත්ම ගැළපෙන පදය පහත වරහන් තුළ දීඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) බ්‍රාහ්මී අක්ෂරවල සිට නූතන සිංහල අක්ෂර දක්වා සිදුවී ඇති වෙනස් වීම ................................ ලෙස හැඳින්වේ.

(ii) බෝ මළුවෙන් නැගෙන සිලිසිලි නද මුසුව හමායන මද ................................... ගත සිත ප්‍රබෝධමත් කරයි.

(iii) ප්‍රධාන ජල .........................................පද්ධතිය වහා ප්‍රතිසංස්කරණය කළ යුතුය.

(iv) ඔලිම්පික් මළල ක්‍රීඩා ....................................... රන් පදක්කම සඳහා තරග වැදුණෝය.

(v) අමරදේව ............................................ සිංහල ගීත කලාවේ පෝෂණය සඳහා සුවිසල් මෙහෙයක් ඉටු කළහ.

(vi) බීරුට්ටුව යනු ජල .......................................... තිසි ලෙස ගණනය කරන ඒකකයකි.

( පරිමාණය, සුරිදු, නළ, පරිණාමය, ශූරීහු, නල )

(ලකුණු 1/2 x 6 = 03)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) වගු + මුතු - ..............................................

(ii) සුධී + ඊෂ්වර - ..............................................

(iii) මහා + උපාධ්‍යාය - ..............................................

(iv) සිපි + එව් - ..............................................

(v) වක් + අත්ත - ..............................................

(vi) සත් + හස් - .............................................. (ලකුණු 1/2 x 6 = 03)

(ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **වැඩිහිටියන් උදෙසා** පහසුකම් ලබාදී **වැඩිහිටියන්ගේ** අයිතිවාසිකම් ලබාදිය යුතුය.

(ii) පක්ෂිහු **කෙඳිවලින්** කුඩු තනා එම **කූඩුවල** බිත්තර රකිති.

(iii) **දරුවනි** තිරිසන් **සතුන්ගෙන්** යහපත් හැසිරීමක් අපේක්ෂා නොකරන්න. (ලකුණු 1/2 x 6 = 03)

(ඊ) සුදුසු විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

(i) හෙම්බා පරිව්‍රාජිකාවෙනි, තෙල බුදුන්ගේ පැනයෙකැයි කී සේක.

(ii) අපි ජය ලබමුයි ඔවුහු පැවසූහ.

(iii) චී චී එහෙම කරන්න එපා.

(ලකුණු 1/2 x 6 = 03)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) මේ රට අපේ යැයි නායකයෝ කීහ.

(ii) පුතුට දෙවියන්ගේ පිහිට ලැබේවායැයි මව පැතුවාය.

(iii) සේවකයන්ගේ වැටුප් වැඩි කරන බව වතු හිමියෝ කීහ.

(ලකුණු 1 x 3 = 03)

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

යාපා නුවර ඉදිකිරීම් ගැන පවසමින් කතුවරයා කියා සිටියේ ඒ සඳහා ගල් වඩුවන් විසි එක්දාහක්, මූලාචාරීන් සීයක්, හන්ගිඩියන් දෙසිය පනහක්, සිත්තරු තුන්දාහක්, ගල්ගාන ආචාරීන් හාරදහසක් සහභාගි වූ බවයි. කුරුණෑගල විස්තරයට අනුව යතොත් යාපව්වෙහි ගල්කරු, ගල් උළුවහු, පේකඩ, ලුණුගැට පන්ති, **ඇත්රූප, ගිරාරූප, අශ්වරූප, මොනර රූප, සිංහරූප,** හක්පිඹිනරූප, **ව්‍යාඝ්‍ර රූප,** හොරණෑපිඹින රූප, මනුෂ්‍ය රූප, බ්‍රහ්මණ රූප, **හංස රූප,** බෙර බැඳගෙන නටන රූප ආදිය නිර්මාණය කළහ. මෙම නිර්මාණ සියල්ල ශෛලමය නිර්මාණ බවත් මෙම නගරයේ වැඩ ගල්වලින් නිමකරණ ලෙස පරාක්‍රමබාහුරජු වදාළ බවත් මෙහි දැක්වෙන කියමනේ සත්‍යතාව යාපහුවට පිවිසෙන කවරෙකුට වුවද දැකබලා ගත හැකිය. මේ සියල්ල වර්තමානයේ දී ද දැකගත හැකිය. ගල්වැඩ කිරීම පමණක් නොව ඒවා සිතුවම් කර තිබූ බවටද කුරුණෑගල විස්තරය පවසයි.

(i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස් කර ලියන්න.

(ii) කුරුණෑගල, ලුණුගැට, සියල්ල යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙනම ලියන්න.

(iii) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

(1) රකාරාංශයක් හා ඌෂ්මාක්ෂරයක් අක්ෂරයක් සහිත වචනයක්
(2) අන්තඃස්ථාක්ෂර තුනක් අන්තර්ගත වචනයක්
(3) අඝෝෂ දන්තජ අක්ෂරයක් හා යංශය සහිත වචනයක්
(4) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.
මූලාචාරීන්, සිත්තරු, සිතුවම්
(5) පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න.
මිශ්‍රක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා (අතීත බහුවචනයක්)

(ලකුණු 3x5 = 15)

08. පහත සඳහන් මාතෘකා අතරෙන් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) විශේෂණ සමාස
(ii) ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය
(iii) ඕෂ්ඨ්‍යජාක්ෂර
(iv) අපර ක්‍රියා
(v) අස්ත්‍යාර්ථ තද්ධිත

(ලකුණු 5x3 = 15)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

# පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය 2020 - සිංහල I

## පිළිතුරු පත්‍රය - I

### I කොටස

01. (අ) (i) බමුණා තුණුරුවන්හි පැහැදී පින්කොට නොමැති නිසා.

(ii) බුදුන් දැක සිත පහදවා ගැනීම නිසා.

(iii) හේතුවකින් තොර උපතක් ඇති බකමුණන් පවා බුදුන් ප්‍රධාන භික්ෂුන් වහන්සේලා කෙරෙහි සිත පහදවාගත් පමණින්.

(iv) තුනුරුවන් යනු බුදුන් දහම් හා සඟුන්ය. බුදුන්වහන්සේත්, බුදුන්වහන්සේ දේශනාකළ ධර්මයත්, බුදුන්වහන්සේගේ අනුගාමික සංඝයා වහන්සේලා තුණුරුවන් ලෙස හඳුන්වනු ලබයි.

(ලකුණු 04 යි)

(ආ) (i) අනුරුද්ධ කුමරු නැතැයි යන වචනයේ අර්ථය දැනගනීවි යැයි සිතූ බැවින්.

(ii) සේවකයා අනුරුද්ධ කුමරු වෙත ගෙන යන හිස් තලිය දිව්‍ය කැවුම්වලින් පිරවීම.

(iii) "මුළු සිරුරම සතුටු කරවාගෙන හත්දහසක් වූ රස නහර රසයෙන් පිරි ශරීරයෙන් මතුවීම.

(iv) කට කෙළවරින්/ මුව අගින්

(ලකුණු 04 යි)

(ඉ) (i) කිඳුරියගේ කන්නලව්වෙන් පඬුපුල් අසුන උණුවීම නිසා කාට හෝ විපත්තියක් දැයි දැනගැනීමට.

(ii) ඉතා සතුටට පත්වී ශක්‍රදේවේන්ද්‍රයාගේ ශ්‍රී පාදය වන්දනා කිරීම.

(iii) ඒ වේලාවේ මහා බෝසතාණන්වහන්සේ අනුන් වෙහෙස කරන්නට මැරුණු ස්වභාවයක් ගෙන නිදාගත් අයෙකු මෙන් සිට යලි නැගී සිටියේය/සුවපත්වූයේය.

(iv) ඉතාම ආදරය කරන දෙදෙනෙකුගෙන් කෙනෙකු වෙන්වීම නිසා සිතේ ඇතිවන දුක නැමැති ගින්න/සිතේ ඇතිවන දුක් ගින්න.

(ලකුණු 04 යි)

(ඊ) (i) විසිතුරු ලෙස මෝස්තර දැමූ දහසක් වටිනා රෙද්දකින්/කම්බිලියකින්.

(ii) රජුට ඇය ගැන ආශාව ඇතිවී, සිහිනැතිව සිටීම

(iii) ස්වර්ණතිලකාවෝ ඇස්කොනින් බලා තමන්ගේ ස්ත්‍රී විලාසයෙන් හැඟීම් දැනවෙන සේ මන්දහාස බැල්මෙන් රජුගේ මුහුණ දෙන බලා.

(iv) සිරුරෙන් විහිදෙන ආලෝකය/ රශ්මිය (ලකුණු 04 යි)

(උ) (i) රජු යුද්ධයට පිවිස කඩුව හැසිරවූ ආකාරය දැකීමෙන්

(ii) මුතුවැළට

(iii) ඔහුගේ කීර්ති නම් වූ වැල ලියලා ගියේය.

(iv) දානය, ශීලය, පරිත්‍යාගය, ඍජුබව, මෘදුබව, තපස, අක්‍රෝධය, ඉවසීම, අවිහිංසාව, විරුද්ධ නොවීම යන රාජධර්ම දහය වේ.

පිළිතුරු අවස්ථා සම්බන්ධය

(ඌ) (i) 13 වන සියවසේ දඹදෙනි යුගයේ විසූ ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්මරත්නාවලියේ මට්ටකුණ්ඩලී කතාවස්තුවෙන් උපුටාගන්නා ලදී. දරුවා නැතිවීමෙන් අදින්නපුබ්බක බමුණා සොහොන අසල හඬමින් සිටින අවස්ථාවේ මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රයා එතනට පැමිණ අදින්න පුබ්බක බමුණාට කළ උපදේශය වේ.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(ii) 13 වන සියවසේ දඹදෙනි යුගයේ විසූ මයුරපාද පරිවේණාධිපති බුද්ධ පුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලියේ එන අනුරුද්ධ කුමාර වස්තුවෙන් උපුටා ගන්නා ලද පාඨයකි. රජකුමරුන් තිදෙන බත් ඉපදීම පිළිබඳව කළ කතා බහේදී කිම්බිල කුමරුගේ අදහසට එරෙහිව භද්දිය කුමරු විසින් පවසන ලද්දකි.

(iii) 14 වන සියවසේ, එනම් කුරුණෑගල යුගයේ බහුකතෘ මණ්ඩලය විසින් සම්පාදිත පන්සිය පනස් ජාතක පොතෙන් උපුටා ගන්නා ලද චුල්ල ධනුද්ධර ජාතක කථාවේ එන පාඨයකි. ගඟ සමීපයේ වනය තුළ නිරුවතින් අසරණව සිටි ස්ත්‍රිය ගඟබඩ සිදුවූ මස්කුට්ටිය සම්බන්ධ සිද්ධියේදී සිවල්වෙස්ගත් ශක්‍රයාට සිනාසුනු අවස්ථාවේදී ශක්‍රයා විසින් ස්ත්‍රීයගෙන් විමසන ලද්දකි.

(iv) 14 වන සියවසෙස් එනම් ගම්පල යුගයේ දෙවන ධර්මකීර්ති මාහිමි විසින් රචනා කරන ලද සද්ධර්මලංකාරයේ එන ස්වර්ණතිලකා කථාවස්තුවෙන් උපුටාගන්නා ලද පාඨයකි. පංච මධුරා පුරයේ රජුට චණ්ඩාල බ්‍රාහ්මණයාගේ පුත්‍රයා ස්වර්ණතිලකා පිළිබඳන කළ චෝදනාව විමසා බලා ස්වර්ණතිලකාගේ පියා කැඳවා රජු විසින් චණ්ඩාල බමුණාට උද්දාල බමුණා පිළිබඳව පහදාදුන් අවස්ථාව හා බැඳේ.

(v) ඒ.පී.ගුණරත්න විසින් පරිවර්තනය කරන ලද 'බැද්දේගම' නවකතාවෙන් උපුටාගත් පාඨයකි. සිළිඳු අසනීප වීම නිසා රෝගය සුවකර ගැනීමට ඔවුන් සිළිඳු, කර්ලිනා, හින්හාමි, පුංචිරාළ ඇතුළු පිරිස බෙරගම දේවාලයට ගිය අවස්ථාවේ දේවාල මංගල්‍ය පවතින විට එහිදී පුංචිරාළ විසින් කර්ලිනා හාමිට මෙම ප්‍රකාශය කරන ලද්දකි.

(vi) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතාණන් විසින් රචිත පේමතෝජායතී සෝකෝ නාට්‍යයේ එන පාඨයකි. ස්වර්ණ තිලකාව සරණ පාවා ගැනීමට අනුචිත බව උද්දාල බමුණාට පැවසූ අවස්ථාවේ උද්දාල බමුණා ඊට එරෙහිව අදහස් දැක්වූ අවස්ථාව හා බැඳේ.

(vii) සයිමන් නවගත්තේගම විසින් ලියන ලද භාවනාව නැමැති කෙටිකතා සංග්‍රහයේ එන "ස්නේහය" නැමැති කෙටිකතාවෙන් උපුටාගත් පාඨයකි. රංකිරා විසින් පදුරු අණ අසලට පැමිණ එය අවුස්සා පුතා එවන ලද ලියුම හොයද්දී ඔහුගේ බිරිඳ වන පුංචිමහයියා පැමිණ ඇය විසින් මෙම ප්‍රකාශය රංකිරා උන්දැට කියන ලදී.

(එ) මෙම පද්‍ය පන්තියේ වස්තු විෂය හා ආකෘතිය පිළිබඳ අවධානය යොමු කරමින් අදාළ උදාහරණ සහිතව රසාස්වාදය කළ යුතුය. මේ පිළිබඳ අවධනාය යොමු කරමින් ලකුණු ප්‍රධානය කරන්න.

- ප්‍රශ්න අංක 02 සිට 08 දක්වා සාහිත්‍ය ප්‍රශ්නවලට අදාළ පිළිතුරු පිළිබඳ අවධානය යොමු කරමින් ලකුණු ප්‍රදානය කරන්න.

## පිළිතුරු පත්‍රය II

## I කොටස

01.

| | | |
|---|---|---|
| (1.1) 5 | (1.2) 4 | (1.3) 1 |
| (1.4) 2 | (1.5) 3 | (1.6) 2 |
| (1.7) 3 | (1.8) 4 | (1.9) 5 |
| (1.10) 1 | (1.11) 3 | (1.12) 3 |
| (1.13) 1 | (1.14) 1 | (1.15) 2 |
| (1.16) 2 | (1.17) 3 | (1.18) 1 |
| (1.19) 4 | (1.20) 3 | |

(ලකුණු 1x20 = 20)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## II කොටස

02. (අ) (i) වරිග තහංචි
තොවිල් තහංචි
(ii) සමාජ සංවිධානයේ සුරක්ෂිතතාව හා පැවැත්ම උදෙසා ක්‍රියාත්මක වීම.
(iii) තම කුලයට නොගැළපෙන පහත් කුලයක කාන්තාවක් විවාහ කර ගැනීමේ දී එම විවාහක තරුණයාට එරෙහිව මෙය ක්‍රියාත්මක වේ.
(iv) සම්මුති බැඳීමක් මගින් සමාව ගැනීමට වරදකරුවන් එකඟ වනතුරු එම යුවළ තාවකාලිකව වරිගයෙන් තෙරපීම (ඥාතීන්ගේ මගුල්, ඉලවු සඳහා සහාගි කර නොගැනීම)
(v) සම්මුති බැඳීමකින් පසුවය.
(vi) වත්කමෙහි පරිදි රිදී 50-100 දක්වා දඩයක් හා වරදකරු ලවා උඩමලුවේ සිටින්නන්හට වන්දවා ඔවුන්ව යළිත් උඩමලුවට ඇතුල්කර ගැනීම.

(ආ) නූතන කෙටිකතාව පැරණි කතාවලට ක්‍රම විකාශයක් වන්නේ ඒවායේ සමාන මෙන්ම අසමාන ලක්ෂණද ඇති බැවිනි.
කතාවක දිග ප්‍රමාණය අනුව එය කෙටිකතාවක් ද නවකතාවක් ද යන්න පැවසිය නොහැක.
නූතන කෙටිකතාවල ප්‍රධාන සිද්ධියක් හා එයට සම්බන්ධ අප්‍රධාන සිද්ධි කීපයක් තිබිය හැකිය.
නවකතාවේ සිද්ධි මාලාවක් ඇතුළත් නිසා කෙටිකතා සන්දර්භය සරලය.
කතාවක වැදගත් අත්දැකීමක් හෝ ජීවන දෘෂ්ටියක් ඇතුළත් විය යුතුය.
පැරණි කතාකරුවාගේ අරමුණ වූයේය පාඨකයාට විනෝද රසයක් උපදේශ ලබාදීම හා ආගම හෝ නීතිය වැනි විෂයක් ඉගැන්වීමය.

03. වචන සංඛ්‍යාව 300 -350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකිය. වචන 400 වැඩි වේ නම් හෝ 250 අඩු වේ නම් හෝ ලකුණු 03 ක් අඩු කළ යුතු වේ.
- වාක්‍ය රචනට ලකුණු දීමේදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසුය.

(i) මාතෘකාවට අදාළව කරුණු ඒකරාශීකරණය.
(ii) එම කරුණු සංවිධානාත්මකව ඉදිරිපත් කිරීම.
(iii) කරුණුවල පැහැදිලි බව.
(iv) නිරවද්‍ය අක්ෂර වින්‍යාසය.
(v) වාක්‍ය ව්‍යාකරණ දෝෂ රහිත බව.
(vi) භාෂාව ව්‍යක්ත ලෙස භාවිතය.
(vii) සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම.
(vii) අත් අකුරුවල පැහැදිලි බව. (ලකුණු 25)

04. (අ) (i) නාවික සෙබළු දොළොස්දෙනෙක් රෝහලට ඇතුලත් කරති.
(ii) නිවරදි වාක්‍යයකි.
(iii) සමාජ චාරිත්‍ර වාරිත්‍ර තුලින් කලට වෙනස් වෙයි.
(iv) නව ජනපතිතුමා විසින් දූෂණ විමර්ශන කොමිසක් පත්කරනු ලබයි.
(v) බොහෝදෙනාගේ ගෞරවයට පාත්‍ර වූ සමාජ සේවිකාව ඊයේ අභාවප්‍රාප්ත වූවාය.
(ලකුණු 1x5 = 05)

(ආ) (i) නළු නිලියන් විසින් ප්‍රේක්ෂකයෝ කුල්මත් කරනු ලබති.
(ii) සෞඛ්‍ය ඇමතිවරිය විසින් නව තනතුරට ලේකම්වරියක් පත්කරනු ලැබුවාය.
(iii) ආදිශිෂ්‍යයන් විසින් ආදි ශිෂ්‍යාවෝ සාදරයෙන් පිළිගනු ලැබුවෝය/ලැබූහ.
(iv) භාෂාවන් විසින් කලින්කලට නවවීතිහු නිර්මාණය කරනු ලැබෙති/ලබති/ලබත්.
(v) මුරකරුවා විසින් අපි කැඳවාගෙන යනු ලැබීමු. (ලකුණු 1x5 = 05)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.
(i) ගුරුවරුන් - දරුවෝ
(ii) දෙවියන් - මිනිස්සු
(iii) අමරසේකරයන් - කලාකරුවෝ
(iv) විචාරකයෙකු - රසිකයෙක්
(v) බල්ලන් - අපට (ලකුණු 1x5 = 05)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

| | වචනය | | අනුඅංගය |
|---|---|---|---|
| 05. (i) | ◆ පුතු | - | ආලපන |
| | ◆ පිණිස | - | හේත්වර්ථ |
| | ◆ කිය-කියා | - | මිශ්‍ර ක්‍රියා |
| (ii) | ◆ මෑණියෝ | - | ගෞරවාර්ථ |
| | ◆ දරුවන්ට | - | සම්ප්‍රදාන |
| | ◆ සිරිත්-විරිත් | - | ද කාරාර්ථසමාස |
| (iii) | ◆ දුප්පත් | - | පරරූප |
| | ◆ උදෙසා | - | පිණිසාර්ථ |
| | ◆ ශිෂ්‍යාධාර | - | ස්වරාදේශ |
| (iv) | ◆ රන්කරුවන් | - | විශේෂණ සමාස |
| | ◆ කිරිමුහුදෙහි | - | ආධාර විභක්ති |
| | ◆ ගිලුණු | - | අතීත කෘදන්ත |
| (v) | ◆ පාලකයන්ගේ | - | සම්බන්ධ විභක්ති |
| | ◆ දුර්වලතා | - | සමූහාර්ථ |
| | ◆ නිසා | - | හේත්වර්ථ |

(ලකුණු (1x3) x 5 = 15)

06. (අ) (i)පරිණාමය (ii) නල (iii) නළ (iv) ශූරිහු (v) සූරිහු (vi) පරිමාණය

(ලකුණු 1/2 x 6 = 03)

(ආ) (i) වංමුතු
(ii) මහෝපාධ්‍යාය
(iii) වක්කත්ත
(iv) සුධීශ්වර
(v) සිපියෙවා
(vi) සන්නස් (ලකුණු 1/2 x 6 = 03)

(ඇ) (i) සම්ප්‍රදාන විභක්ති - සම්බන්ධ විභක්ති
(ii) කරණ විභක්ති - ආධාර විභක්ති
(iii) ආලපන විභක්ති - සම්බන්ධ විභක්ති (ලකුණු 1/2 x 6 = 03)

(ඈ) (i) 'හෙම්බා පරිව්‍රාජිකාවෙනි, තෙල බුදුන්ගේ පැනයෙකැ'යි කී සේක.
(ii) 'අපි ජය ලබමු!'යි ඔවුහු පැවසූහ.
(iii) චී! චී! එහෙම කරන්න එපා

(ලකුණු 1/2 x 6 = 03)

(ඉ) (i) තමන්ගේ රට තමන්ගේ බව නායකයෝ කීහ.
(ii) තමන්ගේ පුතුට දෙවියන්ගේ පිහිට ලැබෙන බව මව පැවසුවාය.
(iii) වතු හිමියෝ සේවක වැටුප් වැඩි කරන බව කීහ.

(ලකුණු 1 x 3 = 03)

07. (i) අශ්වරූප, ඇත්රූප, ගිරාරූප, මොණරූප, ව්‍යාඝ්‍රරූප, සිංහරූප, හංසරූප
(ii) කුරුණෑගල - කෙටිපාපිල්ල, කෙටිපාපිල්ල, දීර්ඝ ඇදපිල්ල
ලුණු ගැට - කෙටි පාපිල්ල, කෙටි ඇදපිල්ල
සියල්ල - ඉස් පිල්ල, හල් පිල්ල, (කොඩිය)

(ලකුණු 1 x 3 = 03)

(iii) (1) බ්‍රාහ්මණ (2) වර්තමානයේ (3) සත්‍යතාව

(iii) මුල + ආචාරීන් (පූර්වස්වරලෝප සන්ධිය)
සිත් + තරු (පූර්වරූප සන්ධිය)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සිතු + කම් (ගාත්‍රදේශ සන්ධිය)

(v) මිශ්‍ර ක්‍රියා - පවසමින්
අසම්භාව්‍ය ක්‍රියා - යතොත්
අවසාන ක්‍රියා (අතීත බහුවචන) - කළහ


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.


WWW.LOL.LK
BUY
PAST PAPERS
071 777 4440
Buy Online - www.LOL.lk
• GCE O/L • PAST PAPERS
• GCE A/L • SHORT NOTES

Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

LOL.lk
Learn Ordinary Level

0

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

**HUGE SALE – SHOP NOW**




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

- GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00